සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2022-08-21
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)**:**

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත මිලර් ඉන්ටර්නැෂනල් සමාගම (MIL),** ඉන්දියාවේ සංස්ථාපනය කරන ලද සමාගමකි. ඔවුන්ගේ මෙහෙයුම් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීමට සමාගමේ අධ්‍යක්ෂකවරු සැලසුම් කරති. මෙම අරමුණ සඳහා MIL හි පරිපාලිත සමාගමක් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලබන අතර, එහි කොටස් හිමිකාරිත්වයෙන් 90% ක් MIL වන් ඉතිරි 10% ශ්‍රී ලාංකික ආයෝජකයෙකුටත් හිමිවනු ඇත. මෙම පරිපාලිත සමාගම, ඉන්දියාවෙන් අමුද්‍රව්‍ය ආනයනය කර, නිමි භාණ්ඩ ලෙස ඉන්දියාවේ පිහිටි මව් සමාගමට ප්‍රති අපනයනය කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකාවේ පරිපාලිත සමාගමේ වාසික තත්ත්වය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ අදාල වන සෘජු බදු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **02** වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන **සීමාසහිත රමීස් (පෞද්ගලික) සමාගම,** 2021/22 තක්සේරු වර්ෂය තුළදී පහත සඳහන් වත්කම් විකුණා ඇත:

| වත්කම් වර්ගය | අත්පත් කරගත් දිනය | මිලදී ගැනීමේ පිරිවැය (රු.) | ඉවත් කළ දිනය | විකිණීමෙන් ලැබුණු මුදල (රු.) | 2017.09.30 දිනට වෙළෙඳපොළ අගය (රු.) |
|---|---|---|---|---|---|
| ඉඩම | 2015.04.15 | 3,000,000 | 2021.12.01 | 5,500,000 | 4,000,000 |
| ලැයිස්තුගත කොටස් | 2020.09.01 | 540,000 | 2021.12.15 | 650,000 | 590,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත එක් එක් ගනුදෙනුවෙන් ඇති වූ ප්‍රාග්ධන ලාභය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) ඉහත ගනුදෙනු මත ගෙවිය යුතු මුළු ප්‍රාග්ධන ලාභ බද්ද **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත රන් කහට සමාගම,** තේ අපනයනයේ නිරත සමාගමකි. 2019/20 තක්සේරු වර්ෂය තුළදී ගංවතුර නිසා රු. මිලියන 10 ක් වටිනා තේ තොගයකට හානි සිදුවූ අතර, රක්ෂණ වන්දිය මඟින් රු. මිලියන 8 ක් ආවරණය කර ගන්නා ලදී. ඉතිරි රු. මිලියන 2 වියදමක් වශයෙන් සමාගම අයකර තිබෙන අතර, එය ආදායම් බදු අරමුණු සඳහා අඩුකරගෙන තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

*"**සීමාසහිත හේලි සහ සමාගම** එදිරිව දේශීය ආදායම් කොමසාරිස් (Hayley & Co. Ltd. Vs. CIR)"* නඩු තීන්දුව පදනම් කර ගනිමින් රක්ෂණයෙන් ආවරණය කරගත නොහැකි වූ තොග හානිය ආදායම් බදු සඳහා අඩු කර ගැනීමට ඉඩදිය හැකිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

2018 වර්ෂයේදී **මහේෂි** ට ඇගේ පියාගෙන් ත්‍යාගයක් වශයෙන් ඉඩමක් ලැබුණි. පවරන ලද දිනයේදී ඉඩමේ වෙළෙඳපොළ අගය රු.5,000,000/- ක් විය.

2021 මැයි 30 දින, **මහේෂි** මෙම ඉඩම, **කසුන්** ට රු.7,500,000/- කට විකුණන ලදි. විකුණූ දිනයේදී එහි වෙළෙඳපොළ වටිනාකම විකුණුම් මිලට සමාන විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත එක් එක් අවස්ථාවේදී මුද්දර බද්ද ගෙවිය යුතු පුද්ගලයා **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ඉහත එක් එක් ගනුදෙනුව මත ගෙවිය යුතු මුද්දර බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**කේදුකේ බේකර්ස්,** බේකරි කර්මාන්තයේ නිරත එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි පුද්ගලයෙකි. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී, උපයන ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ [එකතු කළ අගය මත බදු (VAT) රහිතව]:

| | **රු.** |
|---|---:|
| පාන් විකිණීමෙන් | 37,037,000 |
| රසකැවිලි විකිණීමෙන් | 44,340,000 |
| බේකරි නිෂ්පාදන බෙදාහැරීමට භාවිත කළ වෑන් රථයක් විකිණීමෙන් | 650,000 |

(2) සමාගම කාර්තුව තුළදී පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | **රු.** |
|---|---:|
| රසකැවිලිවලට සම්බන්ධ මිලට ගැනුම් | 1,653,000 |
| පාන්වලට සම්බන්ධ මිලට ගැනුම් | 96,000 |
| පොදු වියදම් මත<br>(පාන් සහ රසකැවිලි යන දෙකටම සම්බන්ධ) | 234,000 |
| අධ්‍යක්ෂවරයෙකුගේ මෝටර් රථයක අළුත්වැඩියා මත | 16,000 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද (input VAT) රු.64,000/- ක් විය.

(4) සමාගම, මාසික එකතු කළ අගය මත බදු (VAT) වාරික වශයෙන් රු.1,000,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 8% ක් ලෙස සළකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත JJ Stars පොදු සමාගම,** ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, එය දේශීය හා විදේශීය වෙළෙඳපොළ සඳහා ටයර් නිෂ්පාදනය කිරීමේ නිරතව සිටියි. සමාගම, 2020/21 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව තවමත් ඉදිරිපත් කර නොමැත.

පවත්නා තොරතුරු ඇසුරෙන්, 2022 මාර්තු 31 දින පැහැර හරින ලද තක්සේරුවක් සහකාර කොමසාරිස්වරයා නිකුත් කර තිබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමට බලයලත් නියෝජිතයෙකු (authorized representative) පත් කිරීමට සමාගමේ අධ්‍යක්ෂකවරු බලාපොරොත්තු වෙති.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පැහැර හරින ලද බදු තක්සේරුවක ඇතුළත් විය යුතු අයිතම තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සමාගමේ බලයලත් නියෝජිතයෙකු ලෙස පත්කළ හැකි පුද්ගලයින් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) පරිපාලන සමාලෝචනයක් සඳහා අභියාචනයක් කිරීමේදී **සීමාසහිත JJ Stars පොදු සමාගම** විසින් අනුකූල විය යුතු කොන්දේසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සිලෝන්ස්ටාර්,** පිළිවෙලින් 2 : 1 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගනිමින් **ඉරේෂ්** සහ **අජිත්** විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයක් වන අතර, කුළු බඩු නිෂ්පාදනය කර දිවයින පුරා බෙදාහැරීමේ නිරතව සිටියි.

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. |
|---|---|
| දළ ලාභය | 22,750,000 |
| පොලී ආදායම | 452,000 |
| | **23,202,000** |
| බෙදාහැරීමේ වියදම් | (8,625,000) |
| පරිපාලන වියදම් | (9,785,400) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **4,791,600** |

(2) ඉහත ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

(i) **ඉරේෂ්** රු.180,000/- ක මාසික වැටුපක් ලබාගන්නා අතර, පාරිභෝගික පදනම පවත්වාගෙන යාම වෙනුවෙන් විශේෂ ගෙවීමක් ලෙස සෑම වර්ෂයකම දළ ලාභයෙන් 10% ක් **අජිත්** ට ලැබෙනු ඇත.

(ii) බෙදාහැරීමේ වාහන මත අය කළ ක්ෂය පිළිබඳ විස්තර පහත දැක්වේ:

| **බෙදාහැරීමේ වාහන** | **පිරිවැය (රු.)** | **අත්පත් කරගත් දිනය** | **වර්ෂය සඳහා ක්ෂය (රු.)** |
|---|---|---|---|
| මෝටර් ලොරිය | 12,000,000 | 2018.04.01 | 1,500,000 |
| මෝටර් බයිසිකලය | 480,000 | 2018.04.01 | 120,000 |
| ත්‍රිරෝද රථය | 580,000 | 2019.04.01 | 145,000 |

(3) **අජිත්ගේ** නිවසේ පළමු මහල හවුල් ව්‍යාපාරයේ කාර්යාලය ලෙස පාවිච්චි කිරීම වෙනුවෙන් වර්ෂයකට රු.360,000/- ක කුලියක් ඔහුට ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත කිඩ්ස් ටෝයිස් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර, සෙල්ලම් භාණ්ඩ ආනයනය කර ඒවා තොග වශයෙන් විකිණීමේ නිරතව සිටියි.

පහත තොරතුරු, **සීමාසහිත කිඩ්ස් ටෝයිස් (පෞද්ගලික) සමාගමේ** 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන තිබේ:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියලු වියදම් අයකිරීමෙන් සහ සියලු ආදායම් බැර කිරීමෙන් පසු බද්දට පෙර ශුද්ධ ලාභය රු.13,150,000/- කි. සමාගමේ මුළු පිරිවැටුම රු.570,000,000/- ක් විය.

(2) වෙනත් ආදායම්වල සංයුතිය:

| | රු. |
|---|---|
| **සීමාසහිත A සමාගමෙන්** ලද ලාභාංශ ආදායම (ලාභවලින් බෙදා හරින ලද) | 840,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 1,930,000 |
| කුලී ආදායම | 360,000 |
| මෝටර් වාහන විකිණීමෙන් ලද ලාභය | 470,000 |

(3) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| **වත්කම් (පිරිවැය)** | **2021.04.01 දිනට ශේෂය (රු.)** | **එකතු කිරීම් (රු.)** | **ඉවත්කිරීම් (රු.)** | **2022.03.31 දිනට ශේෂය (රු.)** |
|---|---|---|---|---|
| ඉඩම | 1,970,000 | 600,000 | - | 2,570,000 |
| කාර්යාල ගොඩනැගිල්ල | 3,230,000 | - | - | 3,230,000 |
| මෝටර් වාහන | 3,200,000 | - | 1,100,000 | 2,100,000 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 1,100,000 | 80,000 | - | 1,180,000 |
| **එකතුව** | **9,500,000** | **680,000** | **1,100,000** | **9,080,000** |

- 2016 මැයි මාසයේදී මිලට ගත් ලොරි රථයක් වර්ෂය තුළදී රු.1,600,000/- කට විකුණන ලද අතර, ඉතිරි මෝටර් වාහන සමන්විත වන්නේ බෙදාහැරීමේ වෑන් රථවලිනි.
- විශේෂයෙන් සඳහන් කර ඇති ඒවා හැර 2021 අප්‍රේල් 01 දිනට පැවති සියලු වත්කම් 2018 අප්‍රේල් මාසයේදී අත්පත් කරගත් ඒවා වන අතර, අත්පත් කරගත් දිනයේ සිට ප්‍රාග්ධන දීමනා ලබාගෙන තිබේ.

(4) පරිපාලන වියදම්හි පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.3,536,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම රු.1,910,000/- කි.
- සමාගම, රු.1,000,000/- ක් වටිනා වෛද්‍ය උපකරණ සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිත්‍යාග කර තිබේ.

(5) බෙදාහැරීමේ වියදම්හි පහත දෑ ඇතුළත් වේ:

- තක්සේරු වර්ෂය තුළදී, සැපයුම්කරුවන් හමුවීම සඳහා අලෙවි කළමනාකරු ඩුබායි රාජ්‍යයට යවන ලද අතර, ඔහුගේ සංචාරය වෙනුවෙන් දරණ ලද පිරිවැය රු.536,000/- කි.
- සමාගමේ අනාගත ගැනුම්කරුවන් සඳහා සංග්‍රහ වියදම් රු.135,000/- ක මුදලක් දරා තිබේ.
- දේශීය මාධ්‍යයන්හි ප්‍රචාරණ දැන්වීම් සඳහා රු.435,000/- ක් දරා තිබේ.

(6) වර්ෂය තුළදී, විශ්‍රාම ගිය සේවකයෙකුට පාරිතෝෂික වශයෙන් රු.625,000/- ක මුදලක් ගෙවා ඇත.

(7) 2021/22 තක්සේරු වර්ෂයේ කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.4,200,000/- ක් සමාගම ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත කිඩ්ස් ටෝයිස් (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

ඉංජිනේරුවරයෙකු වන **රවී,** ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ඇඟළුම් සමාගමක සේවය කරයි.

2021/22 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **රවීගේ** ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසයකට රු.390,000/- බැගින්.
- ගමන් වියදම් දීමනාව - මාසයකට රු.60,000/- බැගින්.
- වර්ෂය තුළදී, ඔහුගේ පුතා රෝහල් ගත කරන ලද අතර, මුළු බිල්පත වූ රු.314,000/- සමාගම විසින් ප්‍රතිපූරණය කරන ලදී. නමුත්, වෛද්‍ය ප්‍රතිපූරණය කිරීම් සම්බන්ධයෙන් සියලු සේවකයන්ට සමාන කොන්දේසි සහිත ප්‍රතිපත්තියක් සමාගම, අනුගමනය නොකරයි.
- එක් මාසයක ප්‍රසාද දීමනාවක් 2021 දෙසැම්බර් මාසයේදී ගෙවන ලදී.
- ඔහු රු.50,000/- ක මාසික කුලියක් ගෙවමින් කුලී නිවසක වාසය කරන අතර, සමාගම ඔහුගේ කුලිය ප්‍රතිපූරණය කරයි.
- සමාගම, ඔහුගේ ජංගම දුරකතන බිල්පත් දරණ අතර, වර්ෂය තුළදී රු.40,000/- ක් ප්‍රතිපූරණය කර තිබේ.
- වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] ලෙස අඩුකරන ලද බද්ද රු.266,880/- ක් විය.

(2) ඔහුට කැගල්ලේ පාරම්පරික නිවසක් හිමි අතර, එය මාසයකට රු.25,000/- ක් බැගින් අසල්වාසියෙකුට කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.150,000/- ක් වන අතර, කුලී නිවැසියා විසින් 30% බැගින් වරිපනම් ගෙවා තිබේ.

(3) ඔහුට, වර්ෂය තුළදී වාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (RFC) මත ඇමරිකානු ඩොලර් 300 (US $ 1 = රු.210/-) ක පොලී ආදායමක් ලැබී තිබේ.

(4) වර්ෂය තුළදී, **රවී** රාජ්‍ය බැංකුවකින් නිවාස ණයක් ලබාගත් අතර, මාසික වාරිකය රු.80,000/- කි. වර්ෂය තුළදී ණය සඳහා පොලිය හා ප්‍රාග්ධන ආපසු ගෙවීම වශයෙන් පිළිවෙලින් රු.490,000/- ක් සහ රු.470,000/- ක් ගෙවා තිබේ.

(5) ලැයිස්තුගත සමාගමකින් ලැබුණු ලාභාංශ (ලද ලාභාංශවලින් ගෙවූ) රු.225,000/- කි.

(6) වකුගඩු රෝගීන්ට ලබාදීම සඳහා පොලොන්නරුව ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග කරන ලද ජල පෙරණවල වටිනාකම රු.800,000/- කි.

(7) **රවීගේ** පුතා විදේශීය විශ්ව විද්‍යාලයක උපාධියක් හදාරන අතර, පාඨමාලා ගාස්තු වශයෙන් ඇමරිකානු ඩොලර් 270 ක් වර්ෂය තුළදී **රවී** විසින් ප්‍රේෂණය කර තිබේ (remitted). *(US $ 1 = රු.210/-)*

(8) ඔහු 2021/22 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීම් වශයෙන් රු.60,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021/22 තක්සේරු වර්ෂය සඳහා **රවීගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |